# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1478/10 – 2007 ජනවාරි 02 වැනි අඟහරුවාදා – 2007.01.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2002 අංක 16 දරන හර බදු පනත**

13 වන වගන්තිය යටතේ නියෝගය

2002 අංක 16 දරන හරබදු පනතේ 13 වැනි වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයේ (V) වන උප ඡේදය මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් වාර්ෂික ඇස්තමේන්තුවලින් සමෘද්ධි අධිකාරිය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන මත භාණ්ඩාගාරයෙන් ලැබෙන අග්‍රිම වෙනුවෙන් සමෘද්ධි අධිකාරිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ගිණුමකින් සිදු කරන ලද හර කිරීම් හර බද්දෙන් නිදහස් විය යුතු බව නිශ්චය කරමි.

1. භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ලැබෙන අග්‍රිම වෙනුවෙන් සමෘද්ධි අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම,
2. සමෘද්ධි අධිකාරියේ කටයුතු වෙනුවෙන් අයිතම 1 හි දැක්වෙන ගිණුමෙන් ලැබෙන අග්‍රිම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක්,
3. සමෘද්ධි අධිකාරියේ කටයුතු වෙනුවෙන් අයිතම 2 හි දැක්වෙන යම් ගිණුමකින් ලැබෙන අග්‍රිම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන ගිණුමක්.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති,<br>
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.)

2006 දෙසැම්බර් 29 වැනි දින,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,<br>
කොළඹ 01.

01-266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.